# මාසික වැඩසටහන 2014 - අගෝස්තු

"කුඩා කල පටන් අධ්‍යාත්මික රසය හඳුනා ගැනීමට හුරුවී සිටි මගෙන්, නාථ දෙවියන් ඇතුළු දෙවිවරුන් පිරිසක් වැඩම කොට දැඩි ලෙස ඉල්ලූ ඉල්ලීමක් ඉෂ්ට කිරීම උදෙසා මම මෙම වැඩපිළිවෙලට ආරම්භය තැබුවෙමි............ "

මේ ප්‍රකාශය සියවසකට පෙරාතුව නුග ගසක් යට හිඳ තෙල් බේත් කුප්පි අලෙවි කල තුන්වන පන්තියේ කට්ටඩියෙකුගේ ග්‍රාම්‍ය වෙළඳ උපක්‍රමයක් නොව අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව රජයේ පාසල් වලට ඖෂධීය කැඳ වර්ගයක් අලෙවි කරන හෙළ සුවය කැඳ නිෂ්පාදන ආයතනයේ අයිතිකාරියගේ ප්‍රකාශයකි.

මේවනවිට මෙම කැඳ වර්ගය පාසැල්සිසුන් අතර බෙදා හැරෙමින් ඇත. ඒ සමග මිථ්‍යා විෂද සිසුනට පොවමින් ඇත.

අපේ රටේ ආයතන පද්ධතිය (රටේ අනාගතය ලෙස හඳුන්වන) සිසු පරපුර අරබයා ක්‍රියා කරන වගකීම් විරහිත හා විසුළු සහගත ආකාරයයි මේ.

රටේ ආයතන පද්ධතිය මිත්‍යාවෙන් වැසී ඒවා මානසික රෝගීන් අතට පත්වන්නාවූ ආකාරය ගෙනහැර දක්වන්නාවූ තවත් නිදසුනකි මේ.

මෙවර අපගේ මාසික වැඩසටහනේ තේමාව වන්නේ මෙම කාරණයයි.

*දෙසුම හා සාකච්ජාව මෙහෙයවීම : ශාන්තා ගම්ලත් මහත්මිය*

දිනය හා වෙලාව : අගෝස්තු 27 බදාදා ප.ව. 4.15 ට

බොරැල්ල කොටා පාරේ ආචාර්ය එන්. එම්. පෙරේරා මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

වැඩසටහන සැමට විවෘතයි !

තාරක වරාපිටිය

ලේකම්